# මහවැලි ජල කළමනාකරණය:

# කාන්තාවගේ භූමිකාව පිළිබඳ පාරිසරික සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්. රාජපක්ෂ - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ලංකාවේ වාරි ජල කළමනාකරණ සමස්ත ක්‍රියාවලියෙහි බලධාරීත්වය ලබන්නේ පුරුෂයා වුවද සමකාලීනව කාන්තාවගේ භූමිකා ප්‍රසාරණය වීමත් සමඟ ගෘහීය අවකාශය ඉක්මවා ගිය කාර්ය කොටසක් කාන්තාව ඉටු කරන බව පෙනෙයි. භූමිකා ප්‍රසාරණය වීමත් සමඟ ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණයෙහිලා කාන්තාවගේ භූමිකාව පාරිසරික සමාජවිද්‍යාත්මකව විභාග කිරීම කාලෝචිතය. මෙම සන්දර්භය තුළ සිට ශ්‍රී ලංකාවේ දියත් වී ඇති මහවැලි ජල කළමනාකරණ ව්‍යාපෘතිය කේන්ද්‍ර කරගනිමින් අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ මහවැලි ජල කළමනාකරණ ක්‍රියාවලිය තුළ කාන්තාවගේ සමාජ සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික වශයෙන් වන භූමිකා තත්වයන් පාරිසරික සමාජවිද්‍යාත්මකව විභාග කිරීමයි. මෙම අධ්‍යයනය සිද්ධි අධ්‍යයනයක් ලෙස සිදු කළ අතර ප්‍රතිචාර දක්වන්නන් 50ක් තෝරාගනු ලැබූයේ අරමුණු සහගත නියැදි ක්‍රමයෙනි. නියැදිය තෝරා ගැනීමේදී මහවැලි ගොවි සංවිධානවල සාමාජිකත්වය දැරීම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සලකා බලන ලදී. ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේදී අර්ධව්‍යුහගත ප්‍රශ්නාවලි 50කින්ද, ගුණාත්මක දත්ත එක්රැස් කිරීමේදී සම්මුඛ සාකච්ඡා 12කින් සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 03කින් ලබාගත් දත්ත මත ද අධ්‍යයනය පදනම් වේ. ප්‍රධාන වශයෙන් ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කරන ලදී. එහිදී තේමා අන්තර්ගත විශ්ලේෂණය යොදාගන්නා ලදී. මෙම අධ්‍යයනයෙන්, සමාජ සංස්කෘතික භූමිකාව තුළ කාන්තාවගේ අධ්‍යාපන චල්‍යතාව මත ඇයගේ සමාජ තත්වය තීරණය වී තිබීම, විධිමත් ජල කළමනාකරණය තුළ උපයෝගීතාමය සහ සක්‍රිය සමාජ ක්‍රියාකාරිණියක් වී තිබීම මෙන්ම සාම්ප්‍රදායික ජල සංස්කෘතියක සහ වාණිජ ජල සංස්කෘතියක උරුමකාරිණියක් වීම හඳුනාගත හැකි විය. ආර්ථික භූමිකාවේ මහවැලි ඉඩම් අයිතිය බහුතරයක් වැන්දඹු කාන්තාවන් සතු වී තිබීම, තරගකාරී ආර්ථික රටාව තුළ විධිමත් සහ අවිධිමත් දායකත්වයක් ලබාදීම හඳුනාගත හැකි විය. එමෙන්ම දේශපාලනික භූමිකාව තුළ දෙවන පරම්පරාවේ කාන්තාවන් සක්‍රියව ගොවි සංවිධානවලට සහභාගී වීම, අදහස් ප්‍රකාශ කිරීම, ප්‍රජා කළමනාකරණය සහ ජල පාලනයට දායකත්වය දැක්වීම යනාදිය හඳුනාගෙන ඇත. ඒ අනුව සමකාලීන ශ්‍රී ලාංකේය කාන්තාව *ද්විත්ව ජල සංස්කෘතියකට උරුමකම් කියමින්* ආර්ථිකමය වශයෙන් *බහු කාර්ය භූමිකාවකට අවතීර්ණ වෙමින්* ජල දේශපාලනයේ *බල සචලතා* මත වාරි ජල කළමනාකරණය තුළ භූමිකා ඉටු කරයි. එබැවින් මෙම අධ්‍යයන ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණයේ කාන්තාවගේ භූමිකාව සාම්ප්‍රදායික පුරුෂ මූලික සන්දර්භය අතික්‍රමණය කළ පැතිකඩක් ලෙස සනාථ වේ.

*මූලික පද: කාන්තාව, භූමිකාව, ජල කළමනාකරණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය*